# විද්‍යාවේදී (වැවිලි කළමනාකරණය) බාහිර උපාධි පාඨමාලාව
# 19 වන කණ්ඩායම (2024 - 2026)
# කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය
# ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය පවත්වනු ලබන විද්‍යාවේදී වැවිලි කළමනාකරණය පිළිබඳ බාහිර උපාධි පාඨමාලාවේ දහනමවන (19) කණ්ඩායම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**ඇතුළත්වීමේ සුදුසුකම්**

පහත සඳහන් සුදුසුකම් වලින් එකක් සහිත වැවිලි කළමනාකරණ ක්ෂේත්‍රයට හෝ කෘෂිකර්ම ක්ෂේත්‍රයට සම්බන්ධ විධායක නිලධාරීන් හෝ වැවිලි කරුවන් හෝ වැවිලි කළමනාකරණ ක්ෂේත්‍රයට හෝ කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ ආයතනවල නිලධාරීන් හට අයදුම් කළ හැකිය.

අ) ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය පවත්වනු ලබන කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ ඩිප්ලෝමාව සහ Modern Agro-Technology ඩිප්ලෝමාව.

හෝ

ආ) වයඹ විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් අනුමත කරනු ලබන අනෙකුත් කෘෂිකාර්මික අධ්‍යාපන ආයතනයකින් පිරිනමන මාස දොළහකට (12) වඩා වැඩි වෙනත් කෘෂිකර්ම ඩිප්ලෝමාවක් සමග වැවිලි කළමනාකරණ ක්ෂේත්‍රයේ හෝ අදාළ ක්ෂේත්‍රයක වසර ක (01) සේවා පළපුරුද්ද සහිත වීම.

හෝ

ඇ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විද්‍යා, ගණිත, වාණිජ යන විෂය ධාරා වලින් හෝ කේම්බ්‍රිජ් හෝ එඩෙක්සෙල් උසස් පෙළ විභාගයේ දී එක්වර විෂයයන් තුනක් (03) ක් සමත් වීම සමග වැවිලි කළමනාකරණ ක්ෂේත්‍රයේ හෝ අදාළ ක්ෂේත්‍රයක වසර තුනක (03) සේවා පළපුරුද්ද සහිත වීම.

**බඳවා ගැනීමේ පටිපාටිය** : ඇතුළුවීමේ සුදුසුකම් සපුරාලන ඉල්ලුම්කරුවන් මූලික කෘෂිකර්මය හා ඉංග්‍රීසි භාෂාව ඇතුළත් ලිඛිත යෝගතා පරීක්ෂණයට ඉදිරිපත්විය යුතුයි. විෂයයන් දෙක සඳහාම අවම වශයෙන් 40% ලකුණු ලබාගන්නා අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ඉහත ඇගැයීම් වලින් සාර්ථක අපේක්ෂයින් පාඨමාලාව සඳහා බඳවාගනු ලැබේ.

**පාඨමාලා අධ්‍යයන කාලය** : අධ්‍යයන වර්ෂ 03 කි (2024– 2026).

**පාඨමාලා මාධ්‍යය** : පාඨමාලාවේ අධ්‍යයන කටයුතු ඉංග්‍රීසි මාධ්‍යයෙන් දුරස්ථ අධ්‍යාපන ක්‍රමය යටතේ පවත්වනු ලැබේ. මුද්‍රිත පාඨමාලා පෙළ පොත් සපයනු ලැබේ.

**පාඨමාලාවේ ගාස්තු** : රු. 275,000/- කි. (ලියාපදිංචි වීමේදී රු. 100,000/- හා ඉතිරිය වාරික 5 කින් ගෙවිය යුතුය).

**ශිෂ්‍යත්ව (10) :** තෝරාගත් අපේක්ෂකයින්ගේ මූල්‍ය අවශ්‍යතා, අධ්‍යාපන සුදුසුකම්, සේවා පළපරුද්ද සහ ඒ ආශ්‍රිත වෙනත් සාධක කිහිපයක් පදනම්ව, පාඨමාලා ගාස්තුව බාගිතව ආවරණය වන පරිදි ශිෂ්‍යත්ව දහයහක් (10) පිරිනැමේ.

**පාඨමාලා ආරම්භය** : 2024 ජනවාරි.

**අයදුම් කිරීම : *pedmis.wyb.ac.lk/registration*** හෝ නිල වෙබ් අඩවිය වන ***https://xpm.mkd.wyb.ac.lk*** හෝ ***www.wyb.ac.lk*** (News & Events) වෙත පිවිසීමෙන් මාර්ග ගත අයදුම්පත පිරවීමට සහ අයදුම් කිරීමට හැකිය.

අයදුම්පත්‍ර ගාස්තුව වන **රුපියල් 2,000/-ක්** මහජන බැංකුවේ මාකඳුර ශාඛාවේ **137 – 1-001 - 2 - 0000171** දරණ ගිණුම් අංකයට බැර කර, රිසිට්පත මාර්ගගත අයදුම්පත්‍රය පිරවීමේදී එයට උඩුගත (**upload**) කල යුතුය. මාර්ගගත අයදුම්පත්‍රය පද්ධතිය හරහා යොමු කිරීමේදී ජනනය වන **PDF** අයදුම්පතේ මුද්‍රණ පිටපතක් සහ රිසිට්පතේ සැබෑ පිටපත ලිපි කවරයේ වම්පස උඩ කෙළවරේ පාඨමාලාවේ නම සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් **03.11.2023** වන දිනට ප්‍රථමයෙන් **සහකාර ලේඛකාධිකාරී, කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, මාකඳුර, ගෝනවිල (NWP)** යන ලිපිනයට එවිය යුතුය.

අසම්පූර්ණ සහ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා ***pedmis.wyb.ac.lk/registration*** වෙත පිවිසෙන්න.

**ලේඛකාධිකාරී,**
**ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, කුලියාපිටිය.**